# සජාතීය සමාජයක් බිහි කිරීමෙහිලා අද්වෛත වේදාන්ත දර්ශනාගත මායාවාදයේ උපයෝගීතාව (සදානන්දයෝගීගේ වේදාන්තසාර කෘතිය ආශ්‍රයෙන්)

Rev. Wilgamuwe Sumanasiri
University of Peradeniya
w.sumanasiri@gmail.com

ලෝකය බොහෝ ගැටළුවලින් පිරී පවතින්නකි. ඒවා නිරාකරණය කර ගැනීම සඳහා ඇති මාර්ගයන් කවරේ ද යන්න පර්යේෂකයා සෙවිය යුතුය. මේ ගැටළු නිරාකරණය කොට සමාජය එක පවුලක් ලෙස සිතීම සඳහා අද්වෛත වේදාන්ත දර්ශනය උපයෝගී කර ගත හැකිය. මේ ලෝකයේ ඇති සියල්ල බ්‍රහ්මගේ මායා ස්වරූපයෙන් නිර්මිත බවත් ලෝභ, ද්වේශ, මෝහ යටපත් කර බ්‍රහ්ම වෙත පැමිණීම අද්වෛත වේදාන්ත දර්ශනය උගන්වයි. අද්වෛත වේදාන්ත දර්ශන උගන්වන ප්‍රධාන මූලාශ්‍රය බ්‍රහ්ම සූත්‍රය වේ. බොහෝ භාෂ්‍ය හා පරිවාර ග්‍රන්ථ පසුව රචනා වී ඇති බව විද්‍යමාන ය. අවසාන වශයෙන් සංගෘහිත කෘතියක් ලෙස සදානන්දයෝගීතුමාගේ වේදාන්තසාර කෘතිය දැක්විය හැකිය. මෙය පූර්ව කෘති සියල්ල පාහේ අධ්‍යයනය කරමින් සංග්‍රහ කොට තිබේ. එසේ ම රචනා ශෛලියේ සුගම බව, නිරවුල් බව හා තාර්කික බව අතින් මෙම කෘතිය ශක්තිමත් ය. මායාවාදයේ දී කඹය සර්පයෙක් ලෙස සලකා බිය වී තැති ගන්නේ යම් සේ ද එසේ ම මේ ලෝකයේ දුක් ස්වභාවය අවබෝධ කොට, තැති ගෙන බ්‍රහ්ම වෙත ළඟා විය යුතු බව උගන්වයි. එය කඹයක් ලෙස අවබෝධ වන විට බ්‍රහ්ම සමීපයට ගොස් තිබේ. එවිට මායාව හෙළි වේ. මේ නිසා අද්වෛත වේදාන්ත දර්ශනයේ උපයෝගීතාවෙන් ලෝකය සුඛිත මුදිත කළ හැකිය. මේ දර්ශනයේ එන මායාවාදය එවිට, සජාතීය සමාජයක් බිහි කරනු ඇත.

**ප්‍රමුඛ පද :** අද්වෛත වේදාන්ත දර්ශනය; මායාවාදය; සමාජ ගැටළු ; වේදාන්තසාර; සජාතීය සමාජය